රටක මහිම - 1

# කැලණි විහාරෙ

ප්‍රථම මුද්‍රණය : 2000
සංශෝධිත මුද්‍රණය : 2013

කතෘ :© ජේ. බී. දිසානායක
ඡායාරූප : © පණ්ඩුක ද සිල්වා
සියළු හිමිකම් ඇවිරිණි

ISBN 978-955-696-028-0

(c) Sumitha Publishers

ප්‍රකාශනය:

**සුමිත ප්‍රකාශකයෝ**
info@sumithabooks.com
www.sumithabooks.com

මුද්‍රණය:

SRIDEVI

ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.,
27, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.
දුරකථනය : 2716709



# පෙරවදන

ශ්‍රී ලංකාවේ වෙසෙන අපි වාසනාවන්තයෝ. අපට අවුරුදු දෙදාස් ගණනකටත් වැඩි කාලයක සිට පැවත එන සංස්කෘතියක උරුමයක් තියෙනවා. මේ උරුමය අපට ලබා දුන්නේ අපේ රජවරුයි, හාමුදුරුවරුයි, පඬිවරුයි, කලා ශිල්පියොයි, පොදු ජනතාවයි. මේ උරුමය දැන හඳුනා ගෙන, එය මතු පරම්පරාව වෙනුවෙන් රැක බලා ගැනීම අපේ යුතුකමක්.

මේ පොතේ අරමුණ ලංකාව පුරා පිහිටි වටිනා ඓතිහාසික ස්ථාන අතරින් එකක් ඔබට හඳුන්වා දීම. ඔබ මේ ස්ථානයට ආවේ වන්දනාකරුවෙකු හැටියට වුණත්, අධ්‍යාපන චාරිකාවක යෙදෙන්නෙකු හැටියට වුණත් මෙහි ඇති ආගමික වටිනාකම වගේම ඓතිහාසික වටිනාකම හඳුනා ගැනීම ඔබට බාරයි.

මේ ස්ථානයේ පූජනීය වටිනාකමත් ඓතිහාසික වටිනාකමත් තේරුම් ගන්ට වුවමනා හැම කරුණාක්ම මෙහි ඇතුළත් කරන්නට අපි වෑයම් කළා. මේ තොරතුරු එක්රැස් කිරීමේදී අපට උදව් උපකාර කළ හැම දෙනාටම අපේ ගෞරවාදර ස්තූතිය පිරිනමනවා.

(c) Sumitha Publishers

තොරතුරු ලබා දීමෙන් පමණක් නොව ඡයාරූප ගැනීමට අනුග්‍රහය දැක්වීමෙන් ද කැළණි රජ මහා විහාරාධිපති, පූජ්‍ය මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමිපාණන් දුන් සහයෝගය ඉත සිතින් අගය කරමි.

මේ ස්ථානය වැඳ පුදා ගෙන හෝ දැක බලා ගෙන හෝ ගියාට පස්සේ මේ ස්ථානය පිළිබඳ මතකය නැවත අලුත් කර ගන්නට මෙහි එන ඡායාරූප උපකාර වෙනවා ඇත. ඉතා සිත් ගන්නා ආකාරයට මේ ස්ථානය ඡායාරූපවලට නැගුවේ පණ්ඩුක ද සිල්වා මහතා.

ඔබ උපන්නේ වටිනා සාරධර්ම පද්ධතියකින් පෝෂණය වුණු සංස්කෘතියක සාමාජිකයෙකු හැටියට. මේ වටිනා සංස්කෘතිය තව දුරටත් පවත්වා ගෙන යෑමට ඔබේ ආධාරය ලැබේවා!

ජේ. බී. දිසානායක

# පටුන


| | | |
|---|---|---|
| 1. | කැලණි විහාරෙ | 5 |
| 2. | කැලණි වෙහෙර වහන්සේ | 6 |
| 3. | රජ පිළිම ගේ | 8 |
| 4. | ඔත් පිළිම ගේ | 18 |
| 5. | අලුත් විහාර ගේ | 20 |
| 6. | රන් පිළිම ගේ | 22 |
| 7. | කැලණියෙ විභීෂණ දේවාලය | 24 |
| 8. | කැලණිය : නාග රාජධානියක් | 26 |
| 9. | කැලණිය මුහුදට යට වූ සැටි | 28 |
| 10. | සිංහල රජ කාලෙ කැලණි විහාරෙ | 30 |
| 11. | කැලණි වෙහෙර වඳින ගාථාව | 32 |
| 12. | කැලණිය ගැන පරණ කතා | 34 |
| 13. | කැලණි විහාරෙන් බුරුම රටට උපසම්පදාව | 36 |
| 14. | පරංගි කාලෙ කැලණි විහාරෙ | 38 |
| 15. | ලන්දේසි කාලෙ කැලණි විහාරෙ | 40 |
| 16. | ඉංග්‍රීසිකාරයෙක් කැලණි විහාරෙ දුටු හැටි | 42 |
| 17. | සැළලිහිණි කවියා කැලණි විහාරෙ දුටු හැටි | 44 |
| 18. | කැලණි විහාරෙ සෙල් ලිපිය | 48 |
| 19. | ලෝකුරු නයිදේගේ 'කැලණි හෑල්ල' | 50 |
| 20. | කැලණි පූජාවලිය | 54 |
| 21. | කැලණි විහාරෙ සංඝ පරම්පරාව | 56 |


(c) Sumitha Publishers

# 1.
# කැලණි විහාරෙ

සීතල දුරුතු මහේදි වන්දනාවෙ යන පිරිස් වැඩිපුරම යන්නේ කැලණියට. කැලණි ගඟබඩ පිහිටි "කැලණි රජ මහ වෙහෙර" සිංහල බෞද්ධයන්ගෙ "සොළොස්මස්ථාන" අතරින් තුන්වෙනි තැනටයි ගැනෙන්නෙ. බුදුන් වහන්සේ කැලණියට වැඩියෙ මෙහි රජ කළ මණිඅක්ඛික රජතුමාගෙ ආරාධනාවෙන්.



එදා සිට අද දක්වා සිංහල බෞද්ධයො ලොකු ශ්‍රද්ධා භක්තියකින් කැලණිය වැඳ පුදා ගන්ට එනවා. කැලණි වෙහෙරෙ නිදන් කරලා තියෙන්නෙ බුදුන් වහන්සේ මණිඅක්ඛික රජතුමා ඇතුළු නායකයන්ට දහම් දෙසූ අවස්ථාවේදී වැඩ හිඳි ආසනේ. දුරුතු පෝයට පෙරහැර බලන්ටත් සැදැහැවත්තු දාස් ගණනින් කැලණියට ඇදී එනවා.

(c) Sumitha Publishers

කැලණි විහාර ගෙයි සිතුවම් නිසාත් කැලණිය ප්‍රසිද්ධියට පත් වුණා. මින් සමහරක් මහනුවර කාලෙදි ඇඳපුවා. ඒ වුණත් ඒවා ඇඳලා තියෙන්නේ උඩරට සිත්තර සම්ප්‍රදායට අනුවම නොවේ. මේ සියවසේ මුල් හරියෙදි සෝලියස් මැන්දිස් මහතා ඇඳපු සිතුවම් තවත් අලුත් සම්ප්‍රදායකට අයිතියි.

මේ පුංචි පොත කැලණි රජ මහා විහාරෙ ගැන.

# 2.
# කැලණි වෙහෙර වහන්සේ

කැලණි රජ මහා විහාරෙ වටිනාම අංගය එහි පිහිටි වෙහෙර වහන්සේයි. ඊට "කල්‍යාණි චෛත්‍යය" "කැලණි සෑය" යන නම් යෙදෙනවා. මේ චෛත්‍යයේ නිදන් කරලා තියෙන්නේ මැණික් පුටුවක්; නැත්නම් මිණි පලඟක්. බුදුන් වහන්සේ තුන්වෙනි වරට ලංකාවට වැඩිය වේලේ බණ කීවේ මේ මැණික් අසුනේ වැඩ හිඳිමින්. සැළලිහිණි කවියා මේ බව කියන්නේ මේ විදියට:

අහසින් අවුත් මිණි අක් නයිඳු යැදුම ට
රහතුන් මැදෙහි මුනි හිඳැ මිණි පලඟ පි ට
දහමුත් දෙසූ තැනැ කළ සැට රියන් කො ට
මහ දාගැබ හිමින් වැඩ සොබාපොය තන් පි ට

(65 කවිය)

මේ මිණි පලඟ බුදුන් වහන්සේට පූජා කළේ චූළෝදරයි මහෝදරයි යන නා රජවරුන් දෙන්නා. මේ මිණි පලඟ මුලින් අයිති වෙලා තිබුණෙ මහෝදර නාග රාජයාගේ පියාණන්ට. එතුමා මරණාසන්න වුණු වේලාවෙ, මේ මිණි පලඟ පැවරුවා චූළෝදර නාග රාජයාගේ මෑණියන්ට. මේ හේතුවෙන් මෙහි අයිතිය ගැන ගැටලුවක් මතු වුණා. එය විසඳා ගන්ට යුද්ධ කරන්ට මේ නාග රජවරු දෙන්නා තීරණය කළා. මේ යුද්ධය වළක්වන්ට බුදු හාමුදුරුවෝ නාගදීපයට වැඩියා. යුද්ධය සමථයකට පත් කළා. දෙ පිරිසටම බණ කීවා. එයින් සතුටට පත් වුණු චූළෝදරයි මහෝදරයි මිණි පලඟ බුදුන් වහන්සේට පූජා කළා.

බුදු හාමුදුරුවෝ ඒ මිණි පලඟෙහි වැඩ හිඳ දානේ වැළඳුවා. නාග දෙපිරිසම තිසරණ පන්සිල්හි පිහිටෙව්වා. ඒ අතර මණි අක්ඛික නම් නාග රජතුමාත් හිටියා. තමාගේ වාසභවන වූ කැලණියට වඩින්ට කියලා රජතුමා බුදුන් වහන්සේට ආරාධනා කළා.

බුදු හාමුදුරුවො මිණි පලඟ භාර ගත්තත් එය ඇරගෙන ගියේ නෑ. ඒක නාගයන්ටම භාර දුන්නා. මණිඅක්ඛික නා රජුගේ ආරාධනාව පරිදි, බුදු හාමුදුරුවො බුදු වෙලා අටවෙනි අවුරුද්දේ වෙසක් පසළොස්වක පෝය දවසෙ කැලණියට වැඩියා. උන්වහන්සේත් උන්වහන්සේ සමග පැමිණි රහතන් වහන්සේලාත් වැඩ ඉන්ට මණ්ඩපයක් හදලා තිබුණා. ඒ මණ්ඩපය තිබුණෙ දැන් කැලණි වෙහෙර වහන්සෙ පිහිටුවලා තිබුණු තැන.

බුදුන් වහන්සේට වැඩ ඉන්ට අර මිණි පලඟ කැලණියට ගෙනැවිත් තිබුණා. උන්වහන්සේ ඒ පලඟෙහි වැඩ හිඳ ධර්ම දේශනා කළා. කැලණි වෙහෙර වහන්සේ වඳින්ට කියන ගාථාවේ තියෙන්නේ මේ අදහස.

බුදුන් වහන්සේ වැඩ සිටීම නිසා මේ මිණි පලඟ පාරිභෝගික චෛත්‍ය අතරට එක් වෙනවා. පාරිභෝගික චෛත්‍යයකට වඳින සැදැහැවතා, බුදුන් වහන්සේට වඳිනවා වගේම භක්තියෙන් ඇළලී යනවා.

මේ දාගැබේ උස "සැට රියනක්" බව කියවෙනවා. "දහමුත් දෙසූ තැන කළ සැට රියන් කොට"

(c) Sumitha Publishers

දාගැබ් වහන්සේ නමකට වඳින කොට එක තැනක සිට නොව තැන් කීපයක සිට වැඳීම බෞද්ධ චාරිත්‍රයක්. ඒ ස්ථාන ගණන හතරක්, අටක් හෝ දාසයක් විය හැකියි. දාසයට "සොළොස" යන පදයක් යෙදෙනවා.

"මහ දාගැප් හිමින් වඳු සොළොස තන් සිට" යනුවෙන් රාහුල හිමියෝ සැළලිහිණියාට උපදෙස් දුන්නා.

හැම දාගැබකටම හැඩයක් තියෙනවා. කැලණි දාගැබේ හැඩය හඳුන්වන්නේ "ධාන්‍යාකාර" යන නමින්. "ධාන්‍යාකාර" කියා කියන්නේ "ධාන්‍ය ගොඩක" හැඩය ඇති යන තේරුමෙන්. කමතක වී ගොඩක් නැත්නම් බැතයක් ගොඩ ගැහෙන්නෙ මේ හැඩයට. දාගැබේ උඩ අඩි 90 ක් විතර වෙනවා.

(c) Sumitha Publishers

කැලණි දාගැබ වරින් වර අලුත්වැඩියා කිරීමට සිංහල රජවරු බොහෝ දෙනෙක් දායක වුණා. දේවානම්පියතිස්ස රජතුමාගේ බාල සහෝදරයා වූ උත්තිය රජතුමා, යටාලතිස්ස රජතුමා, නවවෙනි පරාක්‍රමබාහු රජතුමා ඒ අතර ප්‍රධාන තැනක් ගන්නවා.

කැලණි විහාර මළුවේ තිබුණු තවත් දාගැබක් ගැන සැළලිහිණි සන්දේශයෙහිත් කල්‍යාණි සෙල් ලිපියෙහිත් සඳහන් වෙනවා. එය හැඳින්වුණේ "සිවුරු දාගැබ" යන නමින්. බුදුන් වහන්සේ කැලණි ගඟට බැස, පැන් සනහා ගත් අවස්ථාවේදී සිවුරු තැන්පත් කොට තිබූ ස්ථානයෙහි මේ දාගැබ් වහන්සේ ගොඩ නගපු බවයි බෞද්ධයන්ගේ විශ්වාසය. මේ දාගැබ් වහන්සේ අද දකින්ට නෑ; තිබුණු තැනක ලකුණක් වත් නෑ. පරංගින් අතින් විනාශ වුණු ගොඩනැගිලි අතරට මේකත් අයත් වන්ට පුළුවන්.



# 3.
# රජ පිළිම ගේ

කැලණි විහාර ගෙයි කොටස් හතරක් තියෙනවා. "රජ පිළිම ගේ" "ඔත් පිළිම ගේ" "අලුත් විහාර ගේ" "රන් පිළිම ගේ" යනුවෙන්.

වන්දනාකරුවා මුලින්ම ඇතුල් වන්නේ "රජ පිළිම" ගෙට.

මේ විහාර ගෙයි තියෙන වටිනාම පිළිමය "මණිඅක්ඛික" රජ්ජුරුවන්ගෙ ප්‍රතිමාව. මේ පිළිමය අඹලා තියෙන්නේ දකුණු පැත්තෙ බිත්තියෙ මැද හරියෙ. මේ පිළිමයෙ දකුණු අතින් කඩුවක් ඔසොවා ගෙන සිටිනවා. දෙපැත්තෙන් සිංහයෝ දෙන්නෙක් සිට ගෙන සිටිනවා.

මණිඅක්ඛික රජතුමා තමයි බුදුන් වහන්සේට ආරාධනා කළේ කැලණියට වඩින්ට කියලා. මේ රජතුමාට බුදුන් වහන්සේ මුලින්ම හමු වුණේ උන්වහන්සේ මහියංගණේට වැඩම කළ අවස්ථාවේදී. ඊට පස්සේ උන්වහන්සේ නාගදීපෙට වැඩම කළ අවස්ථාවේදී තමයි උන්වහන්සේට ආරාධනා කළේ කැලණියට වඩින්ට කියලා.

විහාරෙට ඇතුල් වන හරියෙම බිම කොටලා තියෙනවා. "එච්" (H) "ඩී" (D) "ඩබ්ලියු" (W) කියන අකුරු තුනත්, ඉලක්කම් කීපයකුත්. මේ ඉංග්‍රීසි අකුරුවලින් හැඳින්වෙන්නේ මේ විහාර ගේ මෑතකදී අලුත්වැඩියා කරවපු ප්‍රධාන දායිකාවගේ නම. ඈ තමයි විජයවර්ධන පවුල සමග විවාහ වීමෙන් පස්සේ "හෙලේනා විජයවර්ධන" බවට පත් වුණු දායිකාව. විවාහයට කලින් ඇගේ නම "හෙලේනා" (H) "ඩෙප්" (D) "වීරසිංහ" (W).

මේ විහාර ගෙයි ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළේ 1888 වැන්නේ තුන්වෙනි මාසෙ විසිපස්වෙනිදා. ඒ, ඒ අවුරුද්දෙ වෙසක් පසළොස්වක්දා. මේ තොරතුරුයි "$18^{3}_{25}88$" යන ඉලක්කම්වලින් කියවෙන්නේ.

කැලණියෙ සිතුවම් අතර පැරණිම සිතුවම් හමු වන්නේ මේ විහාර ගෙයි. මේ සිතුවම්වලින් බුද්ධ චරිතයටයි, බුද්ධ ශාසනයටයි අදාළ සිද්ධි සමාහාරකුයි ජාතික කතා කීපයකුයි දැක්වෙනවා.

රජ පිළිම ගෙට ඇතුල් වෙලා කෙළින්ම ඉස්සරහ බැලුවාම දකින්ට ලැබෙන බිත්තියෙ උඩින්ම ඇඳලා තියෙන්නෙ "සත් සතිය". බුදුන් වහන්සේ සිරිමා බෝ සමීදුන් අසල පළමුවෙනි සති හත ගත කරපු ආකාරයයි මේ සිතුවම්වලින් දැක්වෙන්නෙ. ඊට පහළින් දැක්වෙන්නෙ ජාතක කතා කීපයක්.

වම් පැත්තෙ බිත්තියෙ උඩින්ම තියෙන්නේ "සොළොස්මස්ථාන". බුදුන් වහන්සේ තුන් වරක් ලංකාවට වැඩියා. ඒ අවස්ථාවලදී උන්වහන්සේ ස්ථාන දාසයකට වැඩම කරලා ඒ ස්ථාන පරිශුද්ධභාවයට පත් කළා. සොළොස්මස්ථානවලින් දහතුනක්ම



(c) Sumitha Publishers


(c) Sumitha Publishers

රජ පිළිම ගෙය


(c) Sumitha Publishers

රජ පිළිම ගෙයි ඇති මණිඅක්ඛික නා රජුන්ගේ පිළිමය


(c) Sumitha Publishers

රජ පිළිම ගෙයි ඇති සත් සතිය සහ ජාතක කථා


(c) Sumitha Publishers

රජ පිළිම ගෙයි වම් පැත්ත බිත්තියේ තියෙන් සොළොස්මස්ථාන